# කෝට්ටේ යුගයේ සම්භාව්‍ය සිංහල සාහිත්‍යයේ ඉතිහාසය හා දියුණුවට බලපෑ හේතු පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (තෝරාගත් සාහිත්‍ය මූලාශ්‍රය කිහිපයක් ආශ්‍රයෙන්)

*අයි. එම්. එම්. මධූෂාන්* [1]

මහින්දාගමනයෙන් පසු ව ක්‍රි. පූ තුන් වන සියවසේ සිට ලංකාවේ ලේඛන කලාවේ භාවිතය සංවර්ධනය වීම ආරම්භ විය. මුල් කාලයේ දී එම ලේඛන කලාව භාවිත කරමින් ලෙන් ලිපි වැනි දේ සටහන් කිරීම පිණිස ය. පැරණි සම්භව්‍ය සිංහල සාහිත්‍ය නිර්මාණය වූයේ අනතුරු ව ය. එකී සම්භව්‍ය සිංහල සාහිත්‍ය ලංකාවේ, එක් එක් යුගයන්වල යම් යම් වෙනස්කම්වලට භාජනය වෙමින් දියුණු විය. කෝට්ටේ යුගය සාහිත්‍යය සංවර්ධනයේ දියුණු අවධියක් නියෝජනය කරයි. එම යුගයේහි සාහිත්‍යයේ දියුණුවට බලපෑ හේතු තොරාගත් මූලාශ්‍රය කිහිපයක් ඇසුරෙන් හඳුනා ගැනීම, මෙම පර්යේෂණයේ අරමුණ වේ. අන් යුගයන්ට සාපේක්ෂ ව කෝට්ටේ යුගයේහි සාහිත්‍යයේ දියුණුවක් ඇති විමට හේතු මොනවා දැයි සොයා බැලීම මෙම පර්යේෂණයේ ගැටලුව වේ. පර්යේෂණ ක්‍රමවේදය ලෙස ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යොදා ගැනිණි. දත්ත සපයා ගැනීමේ දී සාහිත්‍ය මූලාශ්‍රය විමර්ශනය ප්‍රධාන විය. ඒ අනුව ප්‍රාථමික මුලාශ්‍රයත්, ද්විතියක මුලාශ්‍රයත්, මඟින් විමර්ශනය සිදු කරන ලදී. කෝට්ටේ යුගයේ විවිධ වර්ගයේ ග්‍රන්ථ රාශියක් රචනා වු බව, මහාවංසයයේ තෙවන කොටසෙහි සඳහන් වි ඇත. සනදේශ කාව්‍ය, භක්ති කාව්‍ය, හටන් කාව්‍ය, ප්‍රශස්ති කාව්‍ය, සිලෝ කාව්‍ය, අස්න කාව්‍ය, උපදේශ කාව්‍ය, කෝශ ග්‍රන්ථ, ධර්ම ග්‍රන්ථ ඒ අතර වේ. එලෙස ම ගිහි පැවිදි උගත් පඩිවරුන් රාශියක් ග්‍රන්ථකරණයේහි නියැලීම ද, කෝට්ටේ යුගයේ සාහිත්‍යයේ දියුණුවක් ඇති විමට හේතු විය. තොටගමුවේ ශ්‍රි රාහුල හිමි, වැත්තෑවේ හිමි, විදාගම මෛත්‍රි හිමි, පැවිදි උගතුන් ලෙසත් හය වන පැරකුම්බා රජු ගිහි උගතෙකු ලෙසත් ග්‍රන්ථකරණයේ නිරත වුවන් අතර වෙති. තව ද දියුණු පිරිවෙන් නිර්මාණය වි තිබූ බව සාහිත්‍ය මූලාශ්‍රය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය අනුව පැහැදිලි ය. පැපිලියාන සුනේත්‍රා දේවි පිරිවෙන, කැරගල පද්මාවති පිරිවෙන, තොටගමු විජයබාහු පිරිවෙන එසේ බිහි වු පිරිවෙන් අතර වේ. අන් යුගයන්ට සාපේක්ෂ ව, කෝට්ටේ යුගයේහි දියුණු පිරිවෙන් බිහි වීමත්, විවිධ වර්ගයේ පොත පත රචනා වීම නිසාත්, උගත් පඬිවරුන් රාශියක් බිහිවීමත් නිසාත්, සම්භාව්‍ය සාහිත්‍යයේහි දියුණුවක් නිර්මාණය වු ආකාරය සාහිත්‍ය මූලාශ්‍රයවල සඳහන් තොරතුරු, ඔස්සේ නිගමනය කළ හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** කෝට්ටේ යුගය, සාම්භාව්‍ය , සාහිත්‍යය , ලේඛනය , ග්‍රන්ථ

---

[1] ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ, madushamilinda9@gmail.com